# පුරාණ ලංකාවේ රාජ්‍ය පාලනයෙහි ලා බෞද්ධ ආචාරධර්මවල බලපෑම පිළිබඳ ශිලාලේඛන ඇසුරින් කරනු ලබන අධ්‍යයනයක්

ඩබ්ලිව්. ඒ. එම්. සී. මධුමාල් අධිපත්තු[1]

**හැඳින්වීම**

මෙරට අතීතයේ පටන් සමාජ සැකැස්ම අධ්‍යයනයේ දී එහි මූලික හැඩගැස්ම සඳහා බෞද්ධ ආචාරධර්මවල බලපෑම සිදුව තිබේ. පොදුවේ ගත්විට බෞද්ධ ආචාරධර්ම යනු බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන්නට යෙදුන පොදු සමාජ පැවැත්ම තුළ එකිනෙකාගේ මානව අයිතිවාසිකම් තහවුරු කරන පංචශීලය, අෂ්ටාංගශීලය වැනි ප්‍රතිපදාවන් සහ සතර බ්‍රහ්මවිහරණ, සතර සංවරශීලය, සතර අගතිය වැනි ඉගැන්වීම් වේ. මෙම ආචාරධර්ම පිළිපැදීම තුළ මානවයාගේ ජීවත්වීමේ අයිතියේ පටන් සියලු අයිතිවාසිකම් තහවුරු කරගත හැකි වේ. මහින්දාගමනයත් සමඟ මෙරට ඇති වූ බෞද්ධ මුහුණුවරත් සමඟ ලාංකීය සමාජයේ සමාජ, ආර්ථික, දේශපාලන ක්‍රියාවලියන්හි ප්‍රබල වෙනස්කම් සිදු වී ඇති බව හඳුනා ගත හැකි ය. "**සිරිලක්හි නොබෝසත්හු නොරජ්වන්හයි සැහැකුලකොත් සවැනිය මුනිරජ්හු...**" යනුවෙන් අභයගිරි ශිලාලිපියේ සඳහන් කරුණු අනුව මෙරට බෞද්ධයෙකු රජ වීම හා ඔහු බෝධිසත්ත්ව ගුණයෙන් යුක්ත විය යුතු බවට අඟවා තිබේ. එසේ ම රජෙකු ඔටුනු පළඳිනුයේ මහාසඞ්ඝයාට මෙහෙයට උපචාර වශයෙන් බව ද දැක්වීම තුළ රාජ්‍ය පාලනයෙහි ලා බෞද්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ හඳුනා ගත හැකි ය. මෙරට රාජ්‍ය පාලනයෙහි දී නීති සම්පාදනය හා ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීමේ දී පංචශීලප්‍රතිපදාව, දසරාජධර්මයන්හි අඩංගු කරුණු, දානය, ශීලය, භික්ෂුවිනය ආදිය පිළිබඳ ව ගැඹුරින් සලකා බලා ඇති බව ශිලාලේඛනවල අන්තර්ගත කරුණුවලින් පැහැදිලි වේ.

**පර්යේෂණ අරමුණු**

මෙම අධ්‍යයනයේ දී පුරාණ රාජ්‍ය පාලනය සඳහා බෞද්ධ ආචාරධර්මවල බලපෑම හා ඒවා රාජ්‍ය පාලනය සඳහා උපයුක්ත කරගෙන ඇති ආකාරය මෙන් ම එමඟින් රාජ්‍ය පාලන සංවිධානයෙහි සිදු වූ යහපත් ස්වරූපයන් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණු වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

පුස්තකාල අධ්‍යයනයක් මඟින් මූලික වශයෙන් දත්ත එක්රැස් කරගන්නා ලද අතර, අනෙකුත් මූලාශ්‍රය හා සංසන්දනය කරමින් අධ්‍යයනය සිදු කරන ලදී.

[1]. උපාධි අපේක්ෂක (සිව්වන වසර), පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය. *chanakamadhumaladhipaththu@gmail.com*

**පර්යේෂණ ගැටලුව**

පුරාණ ලංකාවේ රාජ්‍යය පාලනයෙහි ලා බෞද්ධ ආචාරධර්මවල බලපෑම කෙසේ වූයේ ද යන්න පිළිබඳ ව පුරාවිද්‍යාත්මකව අනාවරණය වී ඇති කරුණු ඔස්සේ සනාථ කරගැනීම හා සාහිත්‍ය මූලශ්‍රයන්හි දක්වා ඇති මෙරට රාජ්‍යය ප්‍රතිපත්තියෙහි බෞද්ධ ස්වරූපය අතිශයෝක්තියක් ද? නැද්ද? යන්න ගැටලුවට විද්‍යාත්මක ව පිළිතුරු සපයා ගැනීම මෙම අධ්‍යයනයෙහි ගැටලුව ලෙස දක්වාලිය හැකි ය.

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

රාජ්‍යය පාලනය සඳහා බෞද්ධ ආචාරධර්මයන්හි බලපෑම පැහැදිලි ව සඳහන් වන අවස්ථාවක් ලෙස මහාවංශාගත විස්තරය සාක්ෂි දරනු ලබයි. මෙරට බෞද්ධ සංස්කෘතියෙහි ස්ථාපිත වීම පිළිබඳ පැහැදිලි සාක්ෂියක් ලෙස සඳහන් කළ හැකි අවස්ථාවක් ලෙස දුටුගැමුණු රජු විසින් එළාර රජුට එරෙහි ව ගෙන ගිය සටන් ව්‍යාපාරය හඳුනා ගත හැකි ය. "**මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජසැප පිණිස නො වන්නේ ය. සම්බුද්ධශාසනයාගේ ප්‍රතිෂ්ඨාපනය සඳහාම වන්නේ ය.**" ලෙස දුටුගැමුණු රජු විසින් පවසා ඇති බවට මහාවංශයේ සඳහන් පාඨය මඟින් මෙරට රාජ්‍ය පාලනය තුළ බුද්දහමට ප්‍රමුඛත්වය ලැබීම හා රාජ්‍ය පාලනය තුළ බෞද්ධ ආචාරධර්මයන්ට ප්‍රමුඛස්ථානයක් ලබාදීම හඳුනා ගත හැකි ය. "**කප්පති භන්තෙ භික්ඛුසඞ්ඝස්ස ආරාමො'ති පුච්ඡි. ථෙරො කප්පති මහාරාජා'ති වත්‍වා සුත්තං ආහරි. ඉමං අනුජානාමි භික්ඛවෙ ආරාමං**" යන සමන්තපාසාදිකා පාඨය අනුව භික්ෂූන්ට ආරාම කැප බව පිළිගත් අයුරු හා රජතුමා විසින් භික්ෂූන් සඳහා වාසස්ථාන පූජා කිරීමට ඉදිරිපත් වීම තුළ ගිහියන් විසින් පැවිද්දන් හට ලබාදිය යුතු සේනාසන ලබාදීම දානමය පින්කමක් ලෙස ද බෞද්ධ ආචාරධර්මයක් ලෙස ද හඳුනා ගත හැකි ය.

**පර්යේෂණ සීමාව**

මෙම අධ්‍යයනයේ දී ශිලාලේඛනවල සඳහන් කරුණු මඟින් පුරාවිද්‍යාත්මකව පර්යේෂණ ගැටලුවලට අදාළ දත්ත රැස් කිරීම සිදු කරන ලදී.

**පර්යේෂණ සාකච්ඡාව/ප්‍රතිඵල**

බෞද්ධ ආචාරධර්මයන් ආශ්‍රය කොටගනිමින් රාජ්‍ය පාලනය තුළ නීති සම්පාදනය කළ අවස්ථාවක් ලෙස වේවැල්කැටිය 4වන මිහිඳු රජු විසින් කරවන ලද ලිපියෙන් හඳුනා ගත හැකි ය. එහි සොරකම් කිරීමල මිනි මැරීම, සත්ව ඝාතනය වැනි පාපී ක්‍රියාවන් සඳහා අධිකරණ ක්‍රියාමාර්ගවලින් පසු දඬුවම් තීන්දු කොට තිබේ. මිහින්තලා පුවරුලිපියෙහි පළමු ලිපියෙහි 47වන පෙළෙහි අල්ලස් නො ගත යුතු බව දක්වා තිබේ. එසේ ම බෞද්ධ ආචාරධර්මයක් වන පරිසරය සුරැකීම පිළිබඳ ව මිහින්තලා පළමු ලිපියෙහි 50 වන පෙළෙහි ගහකොල නො කැපිය යුතු බව දක්වා තිබේ. එසේ ම ගජබා රජුන් හා පැරකුම්බා රජවරුන් අතර ඇති වූ සමඟි ගිවිසුම පිළිබඳ සඳහන් සංගමු විහාර ලිපියෙහි 12, 13, 14 වන පේළිවල දක්වා ඇති "**මෙට විරුද්ධයක් කළමෝ නම් තුනුරුවන් ආඥා මකුවම්හ. නරකයෙන් මුක්ත නො වුවම්හ**" කරුණු අනුව තෙරුවන්ගේ අණ කඩ නොකිරිමටත් එසේ කළහොත් නරකාදියෙහි වැටෙන බවටත් සමඟි සන්ධානයට පැමිණ තිබේ. රජවරුන් එලෙස බෞද්ධ ආචාරධර්මයන්ට අනුගත ව තම රාජ්‍යපාලන

කටයුතු ගෙන ගොස් ඇති බව පුරාවිද්‍යාත්මක ව සනාථ කරගත හැකි ය. එසේ ම පොළොන්නරු යුගය වන විට ඇති ව තිබූ ශාසනික කඩාවැටීම භික්ෂු සමාජයේ පිරිහීම නිසා සිදුව ඇති බව පොලොන්නරුව ගල්විහාර කතිකාවතින් හඳුනා ගත හැකි ය. එහිදී භික්ෂු සමාජයට ශාසන සංශෝධනයට අවශ්‍ය නීති සම්පාදනයේ දී බෞද්ධ භික්ෂුවක විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම පිළිබඳ ව රජු විසින් පිහිටවූ ශිලාලේඛනයෙහි අණක් ලෙස සටහන් කර ඇත. එහි අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති විභාග කොට ශාසනය නැවත නඟා සිටුවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. එසේ ම ණය ගෙවීම හා පැහැර හැරීම වැනි බෞද්ධ ඉගැන්වීම්වලට පටහැනි ක්‍රියාවන් තහනම් කිරීම රාජ්‍යය ප්‍රතිපත්ති මඟින් සිදු කර තිබේ. මිනී මැරුම් හා සත්ව ඝාතනයන් වළක්වාලීම සඳහා දැඩි දඬුවම් හා ජීවිත වෙනුවෙන් වන්දි ගෙවීමට ද නියෝග කර ඇත. බදුලු ටැම්ලිපිය මඟින් පොහෝ දිනයන්හි වෙළඳාම් කිරීම තහනම් කර ඇත. දඹුලු ගිරිලිපිය මඟින් "මාඝාතය" තහනම් කිරීම තුළ දවස් දක්වා එම දිනයන්හි සත්ව ඝාතනයන් තහනම් කරවීමට රජු පෙළඹවීම තුළ දැකගත හැක්කේ පරපණ නැසීමේ පංචශිල ප්‍රතිපදාව රජුන් විසින් තම රාජ්‍යපාලනය තුළ අවධානයට ලක්කර ඇති බව යි. මීට අමතරව, බදු අයකර ගැනීමේ දී හා දඩ අයකර ගැනිමේ දී අසාධාරණ ලෙස ඒවා එකතු නොකිරීමට වග බලාගෙන ඇත.

**පර්යේෂණ සාරාංශය**

මෙලෙස මෙරට අතීත රාජ්‍යපාලන කටයුතුවල දී පාලකයින් විසින් පංචශීල ප්‍රතිපදාවන් ආරක්ෂා වන පරිදි නීති සම්පාදනය කිරීම හා ප්‍රතිපත්ති සකස් කිරීම සිදු කර ඇත. එසේ ම හොරට මැනීම, හොරට කිරීම, අසාධාරණ ලෙස මහජනයා මත බදු බර පැටවීම් ආදිය සිදු කර නොමැත. එසේ ම රජවරුන් හා සෙසු නිලධාරීන් මෙන් ම ජනතාව විසින් ද ලෙන් පූජා කිරීම, විවිධ දානමානාදිය සිදු කරන ලද අවස්ථාවන් හඳුනා ගත හැකි ය. බෞද්ධ ආචාරධර්මවලට පටහැනි සත්ව ඝාතනය වැනි දේ රජුගේ නියෝග මඟින් තහනම් කර තිබේ. එසේ ම සඞ්ඝ සමාජය කෙරෙහි වූ ගෞරවය ආරක්ෂා කිරීම ද බෞද්ධ ශාසනය ආරක්ෂාව උදෙසා කටයුතු කිරීම ද හඳුනා ගත හැකි ය. මෙලෙස මෙරට රාජ්‍යත්වය ලබාගැනීමේ සිට බෞද්ධ ආචාරධර්මයන් පිළිපදින අයෙකු තෝරා ගැනීමට රටවැසියන් පවා පෙළඹීම තුළ මෙරට අතීත රාජ්‍යය පාලනය බෞද්ධ ආචාරධර්ම අනුව සිදු කර ඇති බවත් සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් කරුණු පුරාවිද්‍යාත්මක ව සනාථ වන බවත් මෙහි දී පැහැදිලි කරගත හැකි විය.

**ප්‍රමුඛ පදඃ** පුරාණ, රාජ්‍ය පාලනය, ආචාරධර්ම, ශිලාලේඛන, ප්‍රතිපත්ති

**මූලාශ්‍රය**


- අමරවංශ, කොත්මලේ (1969). **ලක්දිව සෙල්ලිපි.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.
- සුරවීර, ඒ.වී. (1971). **කතිකාවත් හා භික්ෂු සමාජය.** සී/ස දීපානී මුද්‍රණ/ප්‍රකාශන (පුද්.) සමාගම.
- Paranavithana, S. (1970). **Inscription of ceylon -Vol I**. Sri Lanka: Archaeological Survey Department.
- Paranavithana, S. (1983). **Inscription of ceylon -Vol -II, Part 1**. Sri Lanka: Archaeological Survey Department.